**ශීර්ෂය 158 - රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 06 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 27 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

- මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණ මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්,සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපවන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන. අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය** .

විගණනයට ඉදිරිපත් කළ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි අත්තිකාරම් ගෙවීම් රු.20,000 කින් හා ලැබීම් රු791,560 කින් අඩුවෙන් දක්වා තිබුණි. | .2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.5 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශන සංඛ්‍යා පදනම් කරගත යුතුය. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි සඳහන් හර කිරීම් හා බැර කිරීම් අත්තිකාරම් ගිණුම සමග සැසඳෙන බව දක්වා ඇත. |

**(ආ) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩුව නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වෙනත් අමාත්‍යාංශයක් සතු රු.2,750,000 ක් වූ වාහනයක් පවරා ගැනීමකින් තොරව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුළත් කර තිබුණි. | වාහනයේ හිමිකම විධිමත්ව පවරා ගැනීමට කටයුතු කිරීම කෙරෙහි අවධානය යොමු කරමි. | මෙම වාහනය මුදල් රාජ්‍ය අමාත්‍යවරයා ලෙස සිටි අමාත්‍යවරයෙකු අමාත්‍යාංශයේ රාජ්‍ය අමාත්‍යවරයා ලෙස පත්කළ අවස්ථාවේ රැගෙන ආ අතර එය මෙම අමාත්‍යාංශයට පවරාගන්නා ලෙස දැනුම් දී ඇත. |

**(ඇ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | ---------------------------- |
| i | මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයට තැන්පත් ලැබීම් හා ගෙවීම් ඇතුළත් කර නොතිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | - |
| ii | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයේ දක්වා නොතිබුණි. | - එම - | - |
| iii | අමාත්‍යාංශය මූල්‍ය ක්‍රියාකාරකම්වල යෙදීමක් නොතිබුණද, මූල්‍ය ක්‍රියාකාරකම් වශයෙන් රු 5,999,073 ක් දක්වා තිබුණි. | - එම - | - |

**(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------ | ------------------------------ |
| ඇප තැබිය යුතු නිලධාරීන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇපලේඛනයක් පවත්වා ගත යුතුයි . | ඇපලේඛනයක් පවත්වා නොමැත. |

**(ඉ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය ------------ | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| (i) **රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | | |
| 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන චක්‍රලේඛය | 2017 වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මාස10 ක කාලපමාවකින් 2019 පෙබරවාරි 20 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. 2018 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය 2019 මැයි 31 දින වන විටත් සිදුකර නොතිබුණි. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වත්කම්වල නිවැරදිභාවය භාණ්ඩ සමීක්ෂණයක් මගින් තහවුරු කළ යුතුව ඇත. | 2018 වර්ෂය සඳහා සමීක්ෂණ මණ්ඩල 2019 මාර්තු 11 දිනැති ලිපිය මඟින් පත්කර ඇත. |
| (ii) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය | අමාත්‍යාංශය සතු වාහන සම්බන්ධයෙන් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඉන්ධන දහනය පිළිබඳව පරීක්ෂාවක් සිදු කළ යුතුය. | කඩිනමින් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) **සලසා තිබූ ප්‍රතිපාදන නිෂ්ඵල වීම** | | |
| වැය විෂයක් සඳහා සලසා තිබුණු රු. මිලියන 5,000 ක ප්‍රතිපාදන කිසිඳු උපයෝජනයකින් නොකර මුළු ප්‍රතිපාදනයම ඉතිරිකර තිබුණි. | මුදල් රෙගුලාසි 50 හි සඳහන් විධිවිධාන ඉටුවන පරිදි වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | ප්‍රතිපාදන මුදල ආපසු ලබා ගැනීමට භාණ්ඩාගාරය වෙත 2018 ඔක්තෝබර් 06 දින දන්වා ඇත. |

(ආ) **අධි ප්‍රතිපාදන සලසා තිබීම**

| | | |
|---|---|---|
| වැය විෂයක් සඳහා රු. මිලියන 215 ක අධිප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 82 ක් වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 හි සඳහන් විධිවිධාන ඉටුවන පරිදි වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | රු මිලියන.66.88 ක්වූ ප්‍රතිපාදන මාරුකිරීම් වලින් රු. මිලියන 62.91 ක්ම අමාත්‍යවරයාගේ නිල නිවාසය අළුත්වැඩියාව සඳහා වැයකර තිබුණි. |

**2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2018 ඔක්තෝබර් 19 දිනැති අංක 2018/266 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 4.11 ඡේදය ප්‍රකාරව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කර තිබුණු රු.මිලියන 32 බැරකම් හා බැදීම් බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණි. නමුත් අමාත්‍යාංශයේ බැරකම් ලේඛනයේ බැරකම්වල වටිනාකම රු.මිලියන 41 ක් වී තිබුණි. ඒ අනුව බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ රු.මිලියන 9 ක බැරකම් අඩුවෙන් දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව බැදීම් හා බැරකම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් ලබාදුන් බැරකම් වටිනාකමට සමාන වන පරිදි ගිණුම්වල ඇතුළත් කරන ලදී. . |

**2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිමවී දින 10 ක් ඇතුළත පියවිය යුතුව තිබුණද, අවස්ථා 9 කදී නිකුත් කර තිබුණු එකතුව රු.318,000 ක තත්කාර්ය අතුරු අග්‍රිම දින 21 ක සිට දින 263 ක් දක්වා | මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව කාර්ය නිමවී දින10 ක් ඇතුළත අත්තිකාරම් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. | ප්‍රමාදයන් සිදුවී ඇති බවත් ඉදිරියේදී එවැනි ප්‍රමාදයන් සිදුවීම වළක්වා ගැනීමට කටයුතු කරන බව දක්වා ඇත. . |

| | | | |
|---|---|---|---|
| | පරාසයක කාල ප්‍රමාදයකින් පසුව පියවා තිබුණි. | | |
| (ආ) | නිසි පුරෝකථනයන් නොකර තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදීම නිසා අවස්ථා 07 කදී ලබාදී තිබූ එකතුව රු.245,000 ක තත්කාර්ය අතුරු අග්‍රිමවලින් රු.152,043 ක් ඉතිරි වී ආපසු මුදලින් පියවා තිබුණි. එම ඉතිරිවීම් ලබාදී තිබූ අතුරු අග්‍රිමයෙන් සියයට 51 ක සිට සියයට 83 ක පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | විධිමත් ඇස්තමේන්තුවක් පදනම් කරගෙන තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කළ යුතු වීම. | නිරීක්ෂණයට එකඟ වන බවත් ඉදිරියේදී ඇස්තමේන්තු තාත්වික ලෙස පිළියෙල කිරීමට උපදෙස් ලබාදුන් බව දක්වා ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------------

**3.1 කාර්යසාධනය**

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ 3 වෙනි කාර්තුවේ අමාත්‍යාංශයේ ප්‍රගති වාර්තාව අනුව ධාරිතා සංවර්ධන, පිහන් සංස්ථාව ප්‍රතිව්‍යුහගතකරණය, බීසීසී සමාගම ප්‍රතිව්‍යුහගතකරණය, දැනුම බෙදාගැනීමේ වැඩ සටහන් හා ඉඩම් හා දේපල තක්සේරු කිරීම් යන කටයුතු සඳහා රු.මිලියන 9 ක ප්‍රතිපාදන සලසා තිබුණද එම කාර්යභාරය ඉටුකර නොතිබුණි. | සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කර අපේක්ෂිත කාර්යභාරය ඉටුකළ යුතුයි. | බීසීසී හා සීසීසී ආයතනවල ප්‍රතිව්‍යුහගතකරණය සඳහා යෝජනා ඉදිරිපත් කර නොමැති බව, දැනුම බෙදාහැරීමේ වැඩසටහන් සිදුනොකළ බව හා දේපල තක්සේරු කිරීමේ වැඩසටහන් වෙනත් අමාත්‍යාංශයක අධීක්ෂණයට පත්කර ඇති බව. |
| (ආ) | ඉඩම් හා දේපල තක්සේරු කිරීමේ වැඩසටහන යටතේ රාජ්‍ය වැවිලි සංස්ථාව හා ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වතු මිනුම් කිරීම සඳහා රු. මිලියන 25 ක ප්‍රතිපාදන සලසා තිබුණද, මූල්‍ය ප්‍රගතිය රු 1,494,000 ක් පමණක් වී තිබුණි. | ලබා දී ඇති ප්‍රතිපාදන උපයෝජනය කළ යුතුය. | ප්‍රමාණවත් මිනින්දෝරුවන් නොමැතිවීම හේතුවෙන් මිණුම් කටයුතු ප්‍රමාද වී ඇත. |

### 3.2 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ 2011 ජුනි 10 දින රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව ආරම්භ කර තිබුණද, අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කර නොතිබුණි. එසේ වුවද, සංස්ථාවේ පාලනය යටතේ පැවති ආයතනවල ආදායම් එකතු කිරීම හා එම ආයතන සඳහා මූල්‍ය අනුග්‍රහය දැක්වීම වැනි කාර්යයන් ඉටුකර තිබුණි. 2015 වර්ෂය අවසාන වන විට අමාත්‍යාංශය යටතේ පැවති පාඩු ලබන ආයතන ඵලදායි ව්‍යවසායයන් ලෙස ශක්තිමත් කිරීම උදෙසා සංස්ථාව අමාත්‍යාංශය යටතට පවරා ගෙන තිබුණි. 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා රු.මිලියන 31 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණද , එහි වැඩ කටයුතු ආරම්භ කිරීම හා කාර්ය මණ්ඩල පත් කිරීම 2019 මැයි මාසය වන විටත් ඉටුකර නොතිබුණි. තවද, 2016 වර්ෂයේදී පමණක් රු . මිලියන 2 ක් වැය කර තිබුණි. | සංස්ථාව සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල තීරණයක් ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කඩිනමින් ඉටුකළ යුතුව ඇත. | අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කර නොමැතිබව හා කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් 8 දෙනෙකුගේ සේවා කාලය අවසන් වීමත් සමඟ අධීක්ෂණය සඳහා අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙකු පත්කර ඇත. කාර්ය මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාදී තිබුණද, මුදල් අමාත්‍යාංශයේ යෝජනාව පරිදි නැවත සංස්ථාව ආරම්භ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කර තිබුණි. විවිධ හේතු මත එය අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වී තිබුණි. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල පුහුණු කිරීම සඳහා රු.3,973,258 ක් වැයකර තිබුණි. විධායක නිලධාරීන්ගේ පුහුණුකිරීම සඳහා එම වියදමෙන් සියයට 82 ක් එනම් රු.3,263,241 ක් වැය කර තිබුණි., විධායක නොවන කාර්ය මණ්ඩලය වෙනුවෙන් සැලැසුම් කර තිබූ පරිදි පාඨමාලා ක්‍රියාත්මක කර නොතිබුණි. පුහුණුවීම් සඳහා තෝරාගැනීමේදී පුහුණු අවශ්‍යතා හඳුනාගැනීමක් හෝ තෝරා ගැනීමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබීම හේතුවෙන් එකම නිලධාරීන් කණ්ඩායමක් සඳහා අවස්ථා කිහිපයකදී දේශීය හා විදේශීය පුහුණුවීම් අවස්ථා ලබාදී තිබුණි. | අමාත්‍යාංශයේ කාර්යභාරයන් ඉටුකිරීම සඳහා විධිමත් පුහුණුවීමේ සැලැසුම් පිළියෙල කර ඒ අනුව අඛණ්ඩව පුහුණු අවස්ථා කාර්ය මණ්ඩලයට ලබාදීමට කටයුතු කළ යුතුයි. | විධායක නොවන නිලධාරීන් විසින් ඉල්ලුම් කරන ලද පුහුණුවීම් සඳහා අවස්ථාව ලබා දී ඇත. ඉදිරියේදී නිසි ක්‍රමවේදයක් අනුගමනය කිරීම සඳහා කමිටුවක් පත්කර ඇත. |